ආර්ථික විද්‍යාව
Economics

21 S II

කාලය පැය 03
03 hours

එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## "අ" උප කොටස

1) (i) ආර්ථිකයක් තුළ පවත්නා සම්පත් වර්ගීකරණය කොට ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සම්පත් හිඟකම හා සැපයුම් ඌණතාව යන සංකල්ප අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04)

(iii) පෞද්ගලික දේපොළ හිමිකාරිත්වය වෙළඳ පොළ ආර්ථිකයක සාර්ථකත්වය කෙරෙහි බලපාන්නේ කෙසේද? (ලකුණු 04)

(iv) "ආර්ථික පද්ධතිය කවර ස්වරූපයක් ගනු ලැබුවද මූලික කාර්යයන් පොදු ය" මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) "පුහුණු ශ්‍රමය" හා "මුදල්" ආර්ථික විද්‍යානුකූලව ප්‍රාග්ධනය ලෙස සැලකේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

(i) ආර්ථික පද්ධතියක ආයතනික ලක්ෂණ කවරේ ද? (ලකුණු 02)

(ii) සමාජවාදී විධානගත ආර්ථිකයක සුබවාදී ලක්ෂණ මෙන්ම අසුබවාදී ලක්ෂණයන්ද දැකිය හැකිය. මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) නිදහස් වෙළඳ පොළ ආර්ථිකයක රජයේ මැදිහත්වීම සාධාරණීකරණය කළ හැක්කේ කවර හේතු මත ද? (ලකුණු 04)

(iv) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමෙලා වෙළඳ පොළ ආර්ථික පද්ධතියක් සහ විධානගත ආර්ථික පද්ධතියක් අතර වෙනස විස්තර කරන්න. (ලකුණු 06)

(v) පරිවර්තන අර්ථ ක්‍රම බිහිවීමට පදනම් වූ සාධක විමසන්න. (ලකුණු 04)

(i) ශ්‍රම විභජනය රටක නිෂ්පාදන ඵලදාව ඉහළ නැංවීමට හේතුවන ආකාර පෙන්වා දෙන්න. (ලකුණු 04)

(ii) ආර්ථික පද්ධතියක් යනු කවරේ ද? ආර්ථික පද්ධතියක ප්‍රධාන කාර්ය කවරේ ද? (ලකුණු 04

(iii) ලෝකයේ ආර්ථික පද්ධති ඒකීය ස්වරූපයක් නොගන්නේ කවර හේතු නිසාද? පැහැදිලි කරන්න. (ලකුණු 04

(iv) "ස්වභාවික ප්‍රාග්ධනය" හා "සමාජ ප්‍රාග්ධනය" යන සංකල්ප විස්තර කරන්න. (ලකුණු 04

(v) "සමාජයීය වෙළඳ පොළ ආර්ථික, සමාජවාදී වෙළඳ පොළ ආර්ථික" වලින් වෙනස්වන්නේ කෙසේ ද? (ලකුණු 0

(i) නිෂ්පාදන හැකියා මායිමක් ඇඳීමට පදනම් වන උපකල්පන කවරේ ද? එම උපකල්පන බිඳවැටීම නිෂ්පාද හැකියා මායිමට කවර බලපෑම් ඇති කරයිද? (ලකුණු 0

(ii) ආර්ථිකයක් කාර්යක්ෂම වන්නේ කවර අවශ්‍යතා සම්පූර්ණ වන විට ද? එම අවශ්‍යතා පැහැදිලි කරන්න. (ලකුණු 0

(iii) සූක්ෂම හා සාර්ව ආර්ථික සංකල්ප පැහැදිලි කිරීමට නිෂ්පාදන හැකියා මායිම යොදාගන්නේ කෙසේ ද? ර සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 0

(iv) පහත සිදුවීම් නිෂ්පාදන හැකියා මගින් දක්වන්න.

(අ) නියඟය නිසා කෘෂි නිෂ්පාදනය පහත වැටීම.

(ආ) වගාවට යොදාගත හැකි භූමියෙන් යම් ප්‍රමාණයක් විනාශවී යාම.

(ඈ) ආර්ථිකයේ විරැකියා අනුපාතය ඉහළ යාම.

(ඇ) රටේ පුහුණු ශ්‍රමිකයින් විශාල පිරිසක් විදේශ රටවලට සංක්‍රමණය වීම. (ලකුණු 04)

(v) වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය විස්තර කර ඊට පදනම්වන සාධක විස්තර කරන්න. (ලකුණු 04)

## ''ආ'' ළඹ කොටස

(05) (i) ආර්ථික විද්‍යාඥයාලව ඉල්ලුම නිර්වචනය කොට සඵල ඉල්ලුම ඇති කරන සාධක පරීක්ෂාකරන්න. (ලකුණු 04)

(ii) පෞද්ගලික ඉල්ලුම් වක්‍රය හා වෙළඳ පොළ ඉල්ලුම් වක්‍රය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04)

(iii) ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක ඔස්සේ ඉල්ලුම් නීතිය විග්‍රහකරන්න. (ලකුණු 04)

(iv) ඉල්ලුම් නීතියට පටහැනි ලෙස මිල හා ඉල්ලුම් ප්‍රමාණය හැසිරෙන අවස්ථා තිබේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) A භාණ්ඩයේ උපරිම ඉල්ලුම් මිල රු.80කි. එම ඉල්ලුම් වක්‍රයේ බෑවුමේ පරස්පරය 5කි. මෙම භාණ්ඩයේ ඉල්ලුම් සමීකරණය ගොඩ නගා මිල රු.25 දී ඉල්ලුම් නම්‍යතාව ගණනය කොට දක්වන්න. (ලකුණු 04)

(06) (i) වෙළඳ පොළේ සිටින්නේ ගැණුම්කරුවන් හතර දෙනෙකු පමණි. ඔවුන්ගේ උපරිම ඉල්ලුම් ප්‍රමාණය පිළිවෙලින් 400, 300, 350, 150 වේ. මේ හැම ගැනුම්කරුවෙක්ම මිල රුපියල ක් වැඩිවන විට ඉල්ලුම් ප්‍රමාණය ඒකක 5ක් පහළ දමයි.

(අ) එක් එක් ගැනුම්කරු මුහුණදෙන ඉල්ලුම් සමීකරණ දක්වන්න. (ලකුණු 04)

(ආ) වෙළඳ පොළ ඉල්ලුම් වක්‍රය රූප සටහනක ඇඳ මිල රු.10 දී ඉල්ලුම් නම්‍යතාව ගණනය කොට දක්වන්න. (ලකුණු 04)

(ඇ) වෙළඳ පොළ සැපයුම් ප්‍රමාණය ඒකක 700ක් නම් මෙම භාණ්ඩයේ සමතුලිත මිල ගණනය කොට එම මිල යටතේ එක් එක් ගැනුම්කරු ඉල්ලුම් කරන ප්‍රමාණ ඇස්තමේන්තු කරන්න. (ලකුණු 04)

(ii) මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කරන සාධක කවරේ ද? (ලකුණු 04)

(iii) ඉහළ සිට පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක ලක්ෂ්‍ය නම්‍යතාව හැසිරෙන ආකාරය අනුව ව්‍යාපාරික අයභාර වෙනස්වන අයුරු රූප සටහනක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 04

(07) (i) ලක්ෂ්‍ය මිල ඉල්ලුම් නම්‍යතාව හා චාප මිල ඉල්ලුම් නම්‍යතාවය අතර වෙනස හා නම්‍යතාවන් භාවිතාවන අවස් පෙන්වා දෙන්න. (ලකුණු 04

(ii) පහත දැක්වෙන ඉල්ලුම් සමීකරණ ප්‍රස්තාර ගතකර එම ඉල්ලුම් වක්‍රවල මිල නම්‍යතාව දක්වන්න.

(අ) Qd=200 (ආ) Pd=20 (ලකුණු 0

(iii) හරස් මිල ඉල්ලුම් නම්‍යතාව නිර්වචනය කොට එහි වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 0

(iv) භාණ්ඩ වර්ගකිරීමේදී ආදායම් ඉල්ලුම් නම්‍යතාව යොදාගැනෙන ආකාරය විමසන්න. (ලකුණු 0

(v) ඉල්ලුම් වක්‍රයේ බෑවුමේ පරස්පරයත් මිල ඉල්ලුම් නම්‍යතාවයත් අතර වෙනස හා සම්බන්ධය විස්තර කරන්න. (ලකුණු 0

(08) (i) සැපයුම් ශ්‍රිතය හා සැපයුම් නීතිය අතර සම්බන්ධය පරීක්ෂා කරන්න. (ලකුණු 0

(ii) සැපයුම් වක්‍රය පහළ සිට ඉහළට බෑවුම් වන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 0

(iii) සැපයුම්කරුවන් හතරදෙනෙකුගේ හැසිරීම පහත වගුවේ දැක්වේ.

| | A | B | C | D |
|---|---|---|---|---|
| මිල | 0 | 10 | 10 | 20 |
| සැපයුම් ප්‍රමාණය | 20 | 0 | 10 | 10 |